# මිල, වැටුප් හා සේවා නියුක්තිය

## සමස්ත මිල වෙනස්වීම්

1991 වර්ෂයේ කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ වාර්ෂික සාමාන්‍ය වර්ධනය සියයට 12.2 ක් විය. නිරපේක්ෂ වශයෙන් බලන කළ මෙය සැළකිය යුතු වැඩිවීමක් වුවද 1990 වාර්තාගත සියයට 21.5 ක වර්ධනය හා සසඳන කළ ඉතාමත් සතුටුදායක තත්ත්වයක් ලෙස පෙන්විය හැක. මිළ මට්ටම් වෙනස් වීම් අඩුවීමේ ප්‍රවනතාවය පිළිබිඹු කරමින් 1990 දෙසැම්බර් මාසයේ දර්ශකය ඊට පෙර වසරේ දෙසැම්බර් දර්ශකය සමඟ සැසඳීමේ දී වාර්තාවුණු සියයට 19.6 ක වර්ධනය සමඟ බලන විට 1991දී අදාල කාලය තුල දර්ශකය ඉහළ ගොස් තිබුණේ සියයට 9.0 කිනි. 1991 වර්ෂයේ තොග වෙළෙඳ මිළ දර්ශකයේ වාර්ෂික සාමාන්‍ය වැඩිවීම සියයට 9.2 ක් පමණක් වීමෙන්, මිළ වැඩිවීමේ අනුපාතයේ අඩු වීම ප්‍රාථමික වෙළඳපොළ තත්ත්වයේද දෘෂ්‍යමාන විය. 1990 වසරේදී මෙම වැඩිවීම සියයට 22.2 ක් විය.

1991 ජනවාරි මාසයේදී පාන් සහ කිරිඟු පිටිවල පාලිත මිළ පහත හෙළීමද, කාලගුණික සාධක හේතු කොට ගෙන ඇතැම් කෘෂිභාණ්ඩ සැපයුම් තත්ත්වයේ සිදු වූ සතුටුදායක බලපෑම්ද වර්ෂය තුල මිළ වැඩිවීමේ අනුපාතය සමනය කිරීමට හේතු වූ වැදගත් සාධක විය. සාමාන්‍ය ඍතුමය ස්වභාවයට අනුකූලවෙමින්, වසරේ පළමුවන කාර්තුවේ මිළ වැඩිවීම අඩු මට්ටමක පැවතුණි. දෙවන කාර්තුවේ දී ඇරඹූ මිළ මට්ටමේ ඉහළ යාම තුන්වන කාර්තුවේ දී යල කන්නයේ ආරම්භයත් සමඟ සමනය විය. කෙසේ වුවත්, හතරවන කාර්තුවේදී මිළ මට්ටමේ තියුණු ඉහළයාමක් සිදුවිය.

ඉල්ලුම පාලනය තුලින් උද්ධමනය මැඩලීමේ උත්සාහයන් නොකඩවා පැවතුණි. තෝරාගත් ණය සඳහා ඉහළ සීමාවන් පැනවීම, ප්‍රතිමූල්‍ය පහසුකම් යථානුරූපී කිරීම, බැංකු අනුපාතය තව දුරටත් ඉහළ දැමීම සහ භාණ්ඩගාර බිල්පත් පිළිබඳ විවෘත වෙළෙඳපොල ගණුදෙනු ක්‍රියාශ්‍රීලී කිරීමද මේ සඳහා වූ සංකෂිප්ත මූල්‍ය ප්‍රතිපත්තිමය උපායයන් විය. මූල්‍ය ප්‍රසාරණය නොකඩවා පැවතුනත්, පෞද්ගලික අංශයේ ශුද්ධ ණය වර්ධන අනුපාතය, 1990 ට වඩා 1991 දී අඩු විය.

## පාරිභෝගික මිල

1991 දී කොළඹ පාරිභෝගික මිළ දර්ශකයේ වාර්ෂික සාමාන්‍ය වර්ධනය සියයට 12.2 ක් විය. මෙය 1990 වසරේදී වාර්තා වූ සියයට 21.5 ක වැඩි වීම හා සසඳන කල සැලකිය යුතු අඩුවීමකි. ආහාර හා රෙදිපිළි මිළ වැඩිවීමේ මන්දගාමී බව මිළ ප්‍රසාරණ අනුපාතය අඩුවීමට තුඩුදුන් ප්‍රධාන හේතුව විය. මිළ වැඩිවීමේ අනුපාතය අඩුවීම සතුටුදායක තත්ත්වයක් වුවද, මිළ මට්ටම්හි නිරපේක්ෂ වර්ධනය ඉහළ මට්ටමක පැවතුණි. ආහාරවල ඉහළ මිළ ගණන්, සමස්ථ වැඩිවීමෙන් සියයට 71.8 කට දායක වූ අතර රෙදිපිළි, ඉන්ධන හා ආලෝකය සහ විවිධ කාණ්ඩ පිළිවෙලින් සියයට 5.6 ක්, 4.6 ක් සහ 16.6 ක ප්‍රමාණයන්ගෙන් දායක විය.

1990 පළමුවන කාර්තුවේ මිළ මට්ටමේ සැළකිය යුතු වැඩිවීමක් වාර්තා වූ අතර, ඊට ප්‍රතිවිරුද්ධ ලෙසින් 1991 පළමුවන කාර්තුවේ මිළ වැඩිවීම අවම මට්ටමක විය. පාලන මිළ ගණන් අඩු කිරීම මෙම වාසිදායක වර්ධනයට විශාල ලෙස දායක විය. දෙවන කාර්තුවේදී මිළ ගණන් වල සැළකිය යුතු වැඩිවීමක් සිදුවූවත්, ජූනි සිට සැප්තැම්බර් දක්වා මිළ ගණන් වල අඩුවීමක් සිදු විය. අවුරුද්දේ අවසාන තුන් මාසයේදී තියුණු මිළ වැඩිවීමක් දක්නට ලැබිණි.

දර්ශකයේ සියයට 61.9 ක භරිතයක් ඇති ආහාර උප දර්ශකය, 1990 දී සියයට 23.3 කින් වැඩිවී ඇති අතර, එය 1991 දී ඉහළ ගොස් ඇත්තේ සියයට 11.9 කිනි. පාන් සහ තිරිඟු පිටිවල පාලිත මිළ අඩු කිරීම, ආහාර මිළ වර්ධනය අඩු කිරීමේලා බලපෑ ඍජු කාරකයක් පමණක් නොව, ආදේශක බලපෑම තුලින් සහල් මිළ රඳවා තබා ගැනීමට ආධාර කිරීමේ වක්‍ර කාරකයක්ද විය.

1990 දී සියයට 24.5 කින් වැඩි වූ සහල් වල සාමාන්‍ය මිළ, 1991 දී වැඩිවූයේ සියයට 0.4 කින් පමණි. එළවළු හා ධාන්‍ය වැනි කෘෂි භාණ්ඩයන්ට සතුටුදායක සැපයුමක් ලබාදීමට වාසිදායක දේශගුණික තත්ත්වයන් මහෝපකාරී වූ අතර එය කලින් වසරට වඩා 1991 දී එම භාණ්ඩ මිලෙහි ඉතාමත් මන්දගාමී වර්ධනයක් පවත්වා ගෙන යෑමට ඉවහල් විය. ඊට අමතරව 1991 දී සීනි මිළ අඩු වූ අතර කිරි ආහාර වල මිළ වැඩිවීම සිදුවූයේ ඉතාමත් සෙමිනි. නමුත් මෙම වාසිදායක තත්ත්වයන් මාළු සහ වියලි මිරිස් වල විශාල මිළ ඉහළයාම් මගින් මග හැරුණි. පොල් සැපයුම අඩාල වීම, පොල් මිලෙහි සැළකිය යුතු වැඩිවීමකට හේතු විය. ලෝක වෙළෙඳපොලේ පොල් නිෂ්පාදනයන්හි මිළ වැඩිවීමත් සමහම ඊට අනුරූපව පොල්තෙල් මිළද වැඩිවිය.

**1.34 සංඛ්‍යා සටහන**

**කොළඹ පාරිභෝගිකයන්ගේ මිළ දර්ශකය**
**(1952 = 100)**

| ශීර්ෂය | සාමාන්‍ය | | වාර්ෂික සාමාන්‍යයෙහි ප්‍රතිශත වෙනස | | සමකාලීන ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|
| | 1990 | 1991 | 1989 ට වඩා 1990 | 1990 ට වඩා 1991 | 1989 දෙසැ. වලට වඩා 1990 දෙසැ. වල වෙනසෙහි ප්‍රතිශතය | 1990 දෙසැ. වලට වඩා 1991 දෙසැ. වල වෙනසෙහි ප්‍රතිශතය |
| සියලුම ශීර්ෂ භාන්ඩ අනුව | 1,008.6 | 1,131.5 | 21.5 | 12.2 | 19.6 | 9.0 |
| ආහාර | 1,090.9 | 1220.3 | 23.3 | 11.9 | 20.8 | 9.4 |
| රෙදිපිළි | 610.2 | 678.4 | 24.5 | 11.2 | 12.7 | 9.3 |
| ඉන්ධන හා ආලෝකය | 1934.1 | 2252.5 | 12.5 | 16.5 | 22.8 | 4.9 |
| ගෙවල් කුලී | 109.8 | 109.8 | - | - | - | - |
| විවිධ | 1021.0 | 1146.0 | 18.7 | 12.2 | 16.6 | 9.7 |

මූලයන්: ජන සහ සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව
සහ ශ්‍රී ලංකා මහ බැංකුව

වාර්ෂික සාමාන්‍ය පදනමින් රෙදිපිළි උප දර්ශකය සියයට 11.2 කින් වර්ධනය විය. මෙය පසුගිය වසරේ සියයට 24.5 ක වැඩිවීම සමහ සසඳන විට බොහෝ අඩු මට්ටමකි. 1990 වසරේ දෙසැම්බර් දර්ශකය පසුගිය වසරේ එම මාසයේ දර්ශකය සමග සසඳන කළ වාර්තා වුනු සියයට 12.7 ක වර්ධනය හා බලන කළ 1991 වසරේ අදාල කාලය තුළදී එම වර්ධනය සියයට 9.3 ක් විය.

ඉහළම වැඩිවීමක් (සියයට 16.5) වාර්තා කර ඇත්තේ ඉන්ධන හා ආලෝකය උපදර්ශකයයි. 1990 අගභාගයේදී භූමිතෙල් මිළ වැඩිවීමේ සම්පූර්ණ බලපෑම මෙම කාලයට අදාල වීම මීට ප්‍රධාන වශයෙන්ම හේතු වී ඇත. සබන්, සිගරට් සහ මද්‍යපාන වැනි භාණ්ඩ මිළ වැඩිවීම, විවිධ භාණ්ඩ උප දර්ශකයේ සියයට 12.4 ක වැඩිවීමට හේතු විය. 1990 දී සමානුරූපී වැඩිවීම සියයට 18.7 කි.


## තොග මිළ

1991 වසරේ මිළ ගණන් වර්ධනය වීම අඩුවීම ප්‍රාථමික වෙළෙඳ පොල මට්ටමින් ද පිළිබිඹු කරමින්, 1990 දී සියයට 22.2 ක් වූ තොග අලෙවි මිළ දර්ශකයේ වාර්ෂික සාමාන්‍යය වර්ධනය 1991 දී සියයට 9.2 ක් විය. 1990 දෙසැම්බර් මාසය සමග සසඳන විට 1991 දෙසැම්බර් මාසයේ දර්ශකයේ වැඩිවීම සියයට 8.1 ක් විය.

# තොග අලෙවි මිල දර්ශකය

1974 = 100

මාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

තොග වෙළෙඳ මිලෙහි ද වර්ධන අනුපාතිකය අඩු වීමට ප්‍රධාන හේතුව වූයේ ආහාර මිළ වර්ධනය සෙමෙන් සිදුවීමය. ආහාර කාණ්ඩයේ උපදර්ශකයේ වාර්ෂික සාමාන්‍ය වටිනාකම 1990 දී සියයට 21.7 කින් වැඩිවූ නමුත් 1991 දී එම වැඩිවීම සියයට 8.3 ක් විය.

උප කාණ්ඩයන් අතර විශාලතම වැඩිවීම වාර්තා කරනුයේ, ඛනිජ තෙල් නිෂ්පාදන, රසායන හා රසායන නිෂ්පාදන, මද්‍යපාන හා ප්‍රවාහන උපකරණ උපදර්ශකයන්ය. පසුගිය වසරේ ඛනිජ තෙල් නිෂ්පාදන මිළ වැඩිවීමේ මුළු බලපෑම 1991 වසර වෙත පැවරී තිබීම ඛනිජ තෙල් නිෂ්පාදන උප දර්ශකය තියුණු ලෙස ඉහළ යාමට හේතු විය. කීත්ත, පොහොර සහ ඖෂධ නිෂ්පාදන මිළ වැඩිවීම, රසායන හා රසායන නිෂ්පාදන මිළ වැඩිවීමට මූලික හේතුව වූ අතර ප්‍රවාහන උපකරණ උප දර්ශකයේ ප්‍රසාරණයට ටයර් සහ ඔටෝමෝටිව් බැටරි මිළ වැඩිවීම ප්‍රධාන සාධකය විය. ආංශික වර්ගීකරණයේ දී දේශීය කාණ්ඩයේ උප දර්ශකය, ආනයන කාණ්ඩයේ හෝ අපනයන කාණ්ඩයේ උපදර්ශකයන්ට වඩා සැළකිය යුතු ප්‍රමාණයකින් වැඩි වී ඇත. දේශීය කාණ්ඩයේ උපදර්ශක වාර්ෂික සාමාන්‍ය වටිනාකම 1991 දී සියයට 11.9 කින් වැඩිවූ අතර, ආනයන හා අපනයන කාණ්ඩයන් වැඩිවූයේ පිළිවෙලින් සියයට 6.1 හා 7.5 කිනි. සියළුම වර්ගවල තේ (උඩ්බිම්, මැදිබිම්, පහත්බිම්) මිළ පහත වැටීම අපනයන කාණ්ඩයේ වර්ධනය සීමාකරන ලද අතර කිරිඟු පිටි මිළ පහත වැටීම නිසා ආනයන කාණ්ඩයේද එවැනිම බලපෑමක් ඇති විය.

**1.35 සංඛ්‍යා සටහන**

**තොග අලෙවි මිල දර්ශකය - 1991**

**(1974 = 100)**

| ශීර්ෂය | සාමාන්‍යය | | වාර්ෂික සාමාන්‍යයෙහි ප්‍රතිශත වෙනස | | 1989 දෙසැම්බර් මාසයට වඩා 1990 දෙසැම්බර්වල වෙනසෙහි ප්‍රතිශතය | 1990 දෙසැම්බර් මාසයට වඩා 1991 දෙසැම්බර්වල වෙනසෙහි ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | 1990 | 1991 | 1989 ට වඩා 1990 | 1990 ට වඩා 1991 | | |
| භාණ්ඩ අනුව | | | | | | |
| සියළුම ශීර්ෂ | 651.1 | 710.8 | 22.2 | 9.2 | 17.0 | 8.1 |
| ආහාර | 599.1 | 649.1 | 21.4 | 8.3 | 14.7 | 9.9 |
| මද්‍යපාන | 668.9 | 776.4 | 16.7 | 16.1 | 11.1 | 14.4 |
| රෙදිපිළි හා පාවහන් | 404.7 | 426.3 | 17.8 | 5.3 | 18.8 | 3.4 |
| කඩදාසි නිෂ්පාදන | 722.4 | 747.4 | 31.3 | 3.5 | 30.4 | -1.7 |
| රසායන හා රසායනික නිෂ්පාදන | 423.8 | 495.4 | 45.2 | 16.9 | 40.0 | 23.2 |
| ඛනිජ තෙල් නිෂ්පාදන | 938.4 | 1105.1 | 23.1 | 17.8 | 31.3 | - |
| ලෝහ නොවන නිෂ්පාදන | 1131.4 | 1262.1 | 53.7 | 11.6 | 53.6 | 9.4 |
| ලෝහ නිෂ්පාදන | 568.6 | 566.5 | 21.1 | -0.4 | -0.7 | 0.6 |
| ප්‍රවාහන උපකරණ | 505.4 | 568.4 | 27.7 | 12.5 | 24.7 | 6.4 |
| විදුලි උපකරණ හා සැපයීම් | 532.7 | 600.3 | 24.5 | 12.7 | 4.8 | 13.6 |
| යන්ත්‍රෝපකරණ | 375.1 | 409.7 | 31.3 | 9.2 | 34.6 | 7.5 |
| ඉන්ධන හා ආලෝකය | 1233.6 | 1289.4 | 23.0 | 4.5 | 16.4 | 0.1 |
| විවිධ | 1167.6 | 1214.8 | 11.0 | 4.1 | 4.2 | 3.4 |
| ආංශික වර්ගීකරණය 1 | | | | | | |
| දේශීය ගණය | 590.3 | 660.5 | 26.7 | 11.9 | 22.5 | 6.0 |
| ආනයන ගණය | 578.8 | 614.3 | 26.2 | 6.1 | 16.5 | 6.0 |
| අපනයන ගණය | 874.2 | 939.8 | 13.2 | 7.5 | 9.8 | 13.0 |
| ආංශික වර්ගීකරණය 11 | | | | | | |
| පාරිභෝගික භාණ්ඩ | 631.3 | 688.5 | 21.5 | 9.1 | 15.7 | 9.7 |
| අන්තර් භාණ්ඩ | 714.1 | 781.1 | 21.4 | 9.4 | 18.6 | 3.1 |
| ආයෝජන භාණ්ඩ | 700.3 | 769.3 | 39.1 | 9.8 | 33.9 | 8.4 |

මූලය - ශ්‍රී ලංකා මහ බැංකුව

අවසන් භාවිතාව අනුව වර්ගීකරණයේදී පාරිභෝගික භාණ්ඩ සියයට 9.1 කින් වැඩි වූ අතර අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ පිළිවෙලින් සියයට 9.4 හා 9.8 කින් ඉහළ ගොස් ඇත. මෙම අනුපාතයන් 1990 වසරේදී උප දර්ශකයන් සඳහා පිළිවෙලින් වාර්තා වුණු සියයට 21.6, 22.0 සහ 37.8 යන අනුපාතයන් හා සසඳන කළ ඉතා අඩු මට්ටමකි.

**වැටුප්**

1991 වර්ෂය තුළදී රාජ්‍ය අංශයේ මූල්‍ය වැටුප් 1990 වැටුප් වැඩිවීමට සමාන වැඩිවීමක් පෙන්වූ අතර වසර තුළදී සංවිධානය වූ පෞද්ගලික අංශයේ වැටුප් වැඩිවීම 1990 ට වඩා සුළු වශයෙන් අඩු විය. කෙසේ වෙතත් 1990 හා සසඳා බැලීමේ දී 1991 මිළ මට්ටම් අඩු අනුපාතයකින් ඉහළ නැඟීම නිසා මෙම කාණ්ඩයෙහි මූර්ත වැටුප් වල වෙනසක් සිදු නොවිය.

**සංවිධානය වූ අංශය**

1990 දී සියයට 13.0 කින් වැඩිවූ සියළුම රාජ්‍ය සේවකයින්ගේ මූල්‍ය වැටුප් 1991 දී සියයට 12.1 කින් ඉහළ ගියේය.

රාජ්‍ය අංශයේ ගුරුවරුන්ගේ මූල්‍ය වැටුප් 1991 වසරේදීද, 1990 දී දක්නට ලැබුන වැටුප් වැඩිවීමට සමානව සියයට 10.0 කින් ඉහළ ගියේය. වර්ෂයන් දෙකේදීම මූල්‍ය වැටුප් වැඩිවීම සමාන වුවද 1991 වසරේ සමස්ථ මිළ මට්ටමේ වැඩිවීම අඩු මට්ටමක පැවතීම නිසා එම වර්ෂය තුළදී රජයේ සේවකයින්ගේ මූර්ත වැටුප් වෙනස් නොවිය. මෙය 1990 දී වූ මූර්ත වැටුප් මට්ටම්වල සියයට 7 ක පහළ යාමට වෙනස් තත්ත්වයකි. සමස්ත මූර්ත වැටුප් දර්ශකයෙහි අඩංගු වන, උපාංගයන්ට වෙන්කොට බැලූ කල පැහැදිලි වනුයේ විධායක නොවන නිලධාරීන්ගේ මූර්ත වැටුප්හි සුළු අඩුවීමක් හා සුළු සේවකයින්ගේ මූර්ත වැටුප්හි සුළු වැඩිවීමක් සිදුවී ඇති බවයි. කෙසේ වෙතත් රාජ්‍ය අංශයේ ගුරුවරුන්ගේ මූර්ත වැටුප් අඛණ්ඩව පිරිහුණු නමුදු ඔවුන්ගේ මූර්ත වැටුප් පහළ යාම 1990 ට වඩා 1991 දී අඩු වී ඇත.


පඩි පාලක සභා මගින් ආවරණය වන වෘත්තීන්ගෙන් සමන්විතවන සංවිධානය වූ පෞද්ගලික අංශයේ සමස්ථ මූල්‍ය වැටුප් දර්ශකය 1990 දී වාර්තාවුණු සියයට 16.9 හා සසඳන කළ 1991 දී ඉහළ ගියේ සියයට 14.4 කිනි. 1991 දී මූල්‍ය වැටුප් වැඩි වීමේ වේගය අඩු වූ නමුදු 1990 දී සියයට 3.9 ක පහළ යාමට ප්‍රතිවිරුද්ධව 1991 දී මූර්ත වැටුප් සියයට 2.0 කින් ඉහළ ගියේය. පඩිපාලක සභාව යටතෙහි ඇති කාර්මික හා වාණිජ අංශයෙහි සේවකයින්ගේ මූල්‍ය වැටුප් සියයට 21.1 කින් හා මූර්ත වැටුප් සියයට 8.0 කින් ඉහළ ගිය අතර, සේවා අංශයේ සේවකයින්ගේ මූල්‍ය වැටුප් සියයට 25.7 කින් සහ මූර්ත වැටුප් සියයට 12.0 කින් ඉහළ ගියේය. කෙසේ වෙතත් කෘෂිකාර්මික අංශයේ සේවකයින්ගේ මූර්ත වැටුප් සියයට 0.4 කින් ආන්තික වශයෙන් පහළ ගිය නමුදු ඔවුන්ගේ මූල්‍ය වැටුප් සියයට 11.7 කින් ඉහළ ගියේය.

1991 වර්ෂයේදී වෘත්තීන් කිහිපයකටම අවම වැටුප් වර්ධනයන් ලබා දෙන ලදී. පඩි පාලක සභාව මගින් ආවරණය වන වෘත්තීන් පහක අවම වැටුප් මසකට රු.200/- කින් වැඩිකළ අතර වෘත්තීන් 25 ක මාසික වැටුප රු.300/- කින් ඉහළ ගියේය. වර්ෂයේ මුල් කාලය තුළදී මසකට රු.200/- ක අවම වැටුප් වැඩිවීමක් ලැබූ වෘත්තීන් තුනකටම අනතුරුව රු.300/- ක වැටුප් වැඩිවීමක් ප්‍රදානය කරනු ලැබිණ.

# වැටුප් ප්‍රමාණ දර්ශක අංක

1978 දෙසැම්බර් = 100

ත්‍රෛමාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

**1.36 සංඛ්‍යා සටහන**

**වැටුප් ප්‍රමාණ දර්ශක අංක (1978 දෙස : =100)**

| ශීර්ෂය | 1990 | | 1991 | | 1990 ට වඩා 1991 වෙනසෙහි ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|
| | මූල්‍ය වැටුප් ප්‍රමාණ දර්ශකය | මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකය | මූල්‍ය වැටුප් ප්‍රමාණ දර්ශකය | මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකය | මූල්‍ය වැටුප් ප්‍රමාණ දර්ශකය | මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකය |
| 1 රජයේ සේවකයින් | | | | | | |
| i සියලුම විධායක නොවන නිලධාරීන් | 439.6 | 104.3 | 488.2 | 103.3 | 11.1 | -1.0 |
| ii සුළු සේවකයින් | 513.5 | 121.8 | 582.3 | 123.3 | 13.4 | 1.2 |
| iii සියලුම රජයේ සේවකයන් | 476.8 | 113.2 | 534.6 | 113.2 | 12.1 | - |
| iv රජයේ පැසැල් ගුරුවරුන් | 404.5 | 96.0 | 444.8 | 94.2 | 10.0 | -1.9 |
| 2. පඩි පාලක සභා කර්මාන්තයන්හි කම්කරුවන් | | | | | | |
| i කෘෂිකර්මයේ යෙදී සිටින කම්කරුවන් | 517.2 | 122.7 | 577.7 | 122.2 | 11.7 | -0.4 |
| ii කර්මාන්ත සහ වානිජ කටයුතු වල යෙදී සිටින කම්කරුවන් | 379.5 | 89.9 | 459.6 | 97.1 | 21.1 | 8.0 |
| iii සේවා අංශයේ කම්කරුවන් | 267.8 | 63.5 | 336.5 | 71.1 | 25.7 | 12.0 |
| iv පඩි පාලක සභා කර්මාන්ත- - යන්හි කම්කරුවන් | 453.5 | 107.6 | 518.8 | 109.7 | 14.4 | 2.0 |

මූලයː කම්කරු දෙපාර්තමේන්තුව සහ
ශ්‍රී ලංකා මහ බැංකුව

## සේවා නියුක්තිය

තාවකාලික ඇස්තමේන්තුවලට අනුව, 1991 වර්ෂයේදී සංවිධානය වූ හා සංවිධානය නොවූ පෞද්ගලික අංශයෙහි ශ්‍රේවා නියුක්තිය වර්ධනය වූ අතර, රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය තවදුරටත් අඩු වීමක් පෙන්නුම් කළේය.

රාජ්‍ය අංශයෙහි සේවා නියුක්තිය ඇස්තමේන්තු කිරීමට පදනම් වී ඇත්තේ ශ්‍රී ලංකා මහ බැංකුවේ සංඛ්‍යාන දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවා නියුක්තිය පිළිබඳ සමීක්ෂණයෙන් එකතු කරන ලද දත්තයන්ය. තවද, රාජ්‍ය අනු අංශයෙහි (රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු) සේවා නියුක්තිය පිළිබඳ දත්ත මහා භාණ්ඩාගාරයේ වාර්ෂික සේවා නියුක්ති ඇස්තමේන්තු සමගද ගලපන ලදී. තාවකාලික ඇස්තමේන්තුවලට අනුව 1991 වසර අවසානයේ රාජ්‍ය අංශයේ මුළු සේවක සංඛ්‍යාව 1,307,000 ක් වූ අතර මෙය සියයට 3.3 ක අඩුවීමකි. රාජ්‍ය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා පළාත් පාලන ආයතන යනාදියෙන් සමන්විත වන රජයේ ආයතන වල සේවා නියුක්තිය 1991 වසර අවසාන වන විට 652,600 ක් වූ අතර එය පසුගිය වර්ෂයට වඩා සියයට 0.6 ක වර්ධනයකි. මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවූයේ ආරක්ෂක සේවාවන්හි නියුතු අය ඇතුලත්වන සේවාවන්හි නියුක්ත වූ සේවක කාණ්ඩයෙහි වර්ධනයයි. මෙම කාණ්ඩයෙහි තාවකාලික සේවා නියුක්තිකයින් විශාල සංඛ්‍යාවක්ද ඇතුලත් වෙයි. සේවාවන්හි නියුක්ත සේවක කාණ්ඩය අතහැර බලන විට අනිකුත් රාජ්‍ය අංශයෙහි සේවක කාණ්ඩයන්හි සේවා නියුක්තිය 1990 වර්ෂයට වඩා සියයට 6.8 ක අඩු වීමක් පෙන්නුම් කරන ලදී. රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, රජය විසින් අත්කර ගෙන ඇති ව්‍යාපාර හා රාජ්‍ය අංශයෙහි බැංකු වලින් සමන්විත වන අර්ධ රාජ්‍ය අනු අංශයෙහි සේවා නියුක්තිය ඉකුත් වර්ෂය හා සසඳන කල සියයට 6.9 ක අඩුවීමක් පෙන්නුම් කරයි.

රාජ්‍ය අංශයෙහි සේවක සංඛ්‍යාව අඩු කිරීමේ අරමුණ ඇතිව කලින් විශ්‍රාම යාම සඳහා උනන්දු කරවීමට ක්‍රමයක් 1990 ඔක්තෝබර් මසදී හඳුන්වාදෙන ලදී. මෙම ක්‍රමය යටතේ 1991 වර්ෂය අවසාන වන විට රාජ්‍ය සේවකයින් 44,066 දෙනෙක් විශ්‍රාමයෑම සඳහා කැමැත්ත පලකර තිබුණි. මේ තත්ත්වය රාජ්‍ය අනු අංශයේ වන රැකියා කාණ්ඩයන් කිහිපයකම සේවක සංඛ්‍යාවේ අඩුවීමට හේතුවිය. තවද, අර්ධ රාජ්‍ය අංශයේ විශාල සේවක සංඛ්‍යාවක් නියුතු ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය ජනතාකරණය කිරීමත් ආයතන කිහිපයක් පෞද්ගලීකරණය කිරීමත් යන හේතූන් නිසා එම අංශයේද සේවා නියුක්තියේ අඩුවීමක් පෙන්නුම් කරන ලදී.

රැකියා වර්ගීකරණයට අනුව සකස්කරන ලද සේවා නියුක්ති සංඛ්‍යාවලින් පෙනී යන්නේ පසුගිය වර්ෂයට වඩා විශාල වශයෙන් වෙනස් වීමක් ඇති නොවූ බවකි. මෙම සංඛ්‍යාවලට අනුව රාජ්‍ය අංශයේ විශාලතම රැකියා කාණ්ඩය බර වැඩ කම්කරුවන් වූ අතර මෙම කාණ්ඩයේ මුළු සේවක සංඛ්‍යාව 501,000 ක් විය. 1990 වර්ෂය හා සසඳන කල මෙම රැකියා කාණ්ඩයට අයත් සේවක සංඛ්‍යාව සියයට 5.3 කින් අඩුවී ඇත. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ රාජ්‍ය වතු අංශයෙහි වතු කම්කරුවන්ගේ ප්‍රමාණය සියයට 5.8 කින් අඩුවීමයි. ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙහි සහ ශ්‍රී ලංකා වැවිලි සංස්ථාවෙහි සේවා නියුක්ත වූ වතු කම්කරු සංඛ්‍යාව 1990 වසර අවසාන වන විට 394,100 ක් වූ අතර 1991 වසර අවසාන වන විට එම සංඛ්‍යාව 371,100 ක් වූ බව ඇස්තමේන්තු කර ඇත.

වෘත්තීය, ශිල්පීය හා ඊට සම්බන්ධ සේවක සංඛ්‍යාව 1991 වසරේ 248,700 ක් වූ අතර මෙය රාජ්‍ය අංශයේ මුළු සේවක සංඛ්‍යාවෙන් සියයට 19 ක් විය. මෙම කාණ්ඩයේ සේවක සංඛ්‍යාව පසුගිය වසරට වඩා සියයට 6.0 ක අඩුවීමක් පෙන්නුම් කරනු ලබන බව ඇස්තමේන්තු කර ඇත. රාජ්‍ය අනු අංශයෙහි මෙම කාණ්ඩයට අයත් මුළු සේවා නියුක්ති ප්‍රමාණයෙන් සියයට 73.4 ක් පාසැල් ගුරුවරු වන අතර, පසුගිය වර්ෂයට වඩා එහි සේවා නියුක්ති ප්‍රමාණය සියයට 4.4 ක අඩු වීමක් පෙන්නුම් කර ඇත. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ දිරිගැන්වීමේ ක්‍රමය යටතේ පාසැල් ගුරුවරුන් බොහෝ දෙනෙක් කලින් විශ්‍රාම ගැනීමට කැමැත්ත පල කිරීමයි. ඊට ප්‍රතිවිරුද්ධව රාජ්‍ය අනු අංශයේ මෙම කාණ්ඩයට අයත් වෛද්‍ය වරුන්ගේ සංඛ්‍යාව පසුගිය වසරට වඩා සියයට 9.8 ක වැඩිවීමක් දක්වමින් 4,500 ක් ව ඇත. මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ විශ්ව විද්‍යාල නැවත විවෘත කිරීමෙන් අනතුරුව වෛද්‍ය උපාධිදාරීන් විශ්ව විද්‍යාලවලින් පිටවීමත් ඔවුන්ට පත්වීම් ලබාදීමත්ය. රාජ්‍ය අංශයේ ලිපිකරු හා ආශ්‍රිත සේවක සංඛ්‍යාව 1991 වර්ෂයේදී 202,700 ක් වශයෙන් ඇස්තමේන්තු කර ඇති අතර පසුගිය වසර තුලදී මෙම කාණ්ඩයේ සේවා නියුක්තිය සියයට 8.0 ක අඩුවීමක් පෙන්නුම් කරයි. සේවාවන්හි නියුක්ත සේවක සංඛ්‍යාව 1991 අවසාන වන විට 253,900 ක් වූ අතර, එය සියයට 14.3 ක වැඩිවීමක් පෙන්නුම් කරන ලදී.

පෞද්ගලික අංශයෙහි සේවා නියුක්තිය පිළිබඳව වාර්ෂික දත්ත නොමැති බැවින් එම අංශයෙහි සේවා නියුක්තිය තක්සේරු කිරීමට අර්ථසාධක අරමුදල්හි ලියා පදිංචි සේවක සංඛ්‍යාව වැනි වෙනත් දර්ශක යොදා ගැණුනි. 1990 වර්ෂය අවසාන වන විට සේවක අර්ථ සාධක අරමුදලේ වූ ක්‍රියාකාරී ගිණුම් සංඛ්‍යාව 1,188,757 සිට1,267,835 දක්වා වැඩිවූ අතර, එය සියයට 6.7 ක වැඩිවීමකි. අනුමත කළ අර්ථසාධක අරමුදල්හි පෞද්ගලික අංශයේ සේවක සංඛ්‍යාව 1991 වර්ෂයේදී පසුගිය වසරට වඩා සියයට 25.0 පමණ වැඩිවීමක් පෙන්නුම් කරයි.

මහ කොළඹ ආර්ථික කොමිසමට (ම.කො.ආ.කො.) අයත් ආයතන වල සේවක සංඛ්‍යාව 1991 වසර තුලදී සියයට 19.4 කින් පමණ වැඩිවිය. 1991 වසරේ දෙසැම්බර් වන විට එහි මුළු සේවක සංඛ්‍යාව 85,457 ක් වූ අතර ඉන් සියයට 78.0 ක් ස්ත්‍රීහු වූහ. මහ කොළඹ ආර්ථික කොමිසමේ ව්‍යාපාර වල සේවා නියුක්ත වූවන්ගෙන් සියයට 57 ක් පමණ කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපයෙහි ක්‍රියාත්මක වන ව්‍යාපෘති 71 ක සේවයෙහි නිරත වූහ. 1991 වසරෙහි මැද භාගයේදී පිහිටුවන ලද කොග්ගල ආයෝජන ප්‍රවර්ධන කලාපය මගින් පුද්ගලයින් 20,000 කට රැකියා අවස්ථා සැපයීමට බලාපොරොත්තු වේ.

ස්වයං රැකියා තුලින් දුගී බව තුරන් කිරීමේ වැඩ පිළිවෙල කෙරෙහි රජයේ අවධානය තවදුරටත් යොමු විය. ආදායම් උත්පාදන කටයුතු සඳහා වූ විවිධ ණය යෝජනාක්‍රම යටතේ ණය පහසුකම් සැලසීම, පුළුල් කිරීම නොකඩවා කෙරුණි. 1991 වර්ෂය අවසාන වන විට පළමු සහ දෙවන අදියර යටතේ වූ ජනසවිලාභී පවුල් 94,861 ක් දැනටමත් ආදායම් උත්පාදන කර ගැනීමේ කටයුතු සාර්ථක ලෙස ස්ථාපිත කරගෙන ඇති බව වාර්තාවේ. ස්වයං රැකියා සඳහා තවත් ජනසවිලාභී පවුල් 58,704 ක් ණය පහසුකම් ලබා ගෙන ඇති අතර ආදායම් උත්පාදන කටයුතු වල නියැලෙමින් සිටී.

ගල්ප් අර්බුදය හේතු කොට ගෙන 1991 පළමු කොටස තුලදී බටහිර ආසියාවේ විදේශ රැකියා අවස්ථාවන්හි තාවකාලික පසුබැමක් ඇතිවුවද, එම අර්බුදය නිමවීමත් සමඟ රැකියා සඳහා විදේශගත වන්නන්ගේ සංඛ්‍යාවෙහි තියුණු වැඩිවීමක් ඇති විය. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහ ලියාපදිංචි රැකියා ඒජන්තවරුන් මාර්ගයෙන් 1991 දී විදේශ රැකියා ලබාගත් මුළු සංඛ්‍යාව 65,007 කි. මෙය පසුගිය වසරට වඩා සියයට 52.5 ක වැඩිවීමකි. කෙසේ වෙතත්, විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් කරන ලද ගුවන් තොටුපළ සමීක්ෂණයකට අනුව ලියා පදිංචි ඒජන්තවරුන් සහ කාර්යාංශය මගින් විදේශ රැකියා සඳහා යන සංඛ්‍යාව මුළු විදේශ රැකියා සංඛ්‍යාවෙන් දළ වශයෙන් අඩක් පමණ වන බව පෙන්නුම් කර ඇත.